01 අතුරු ආරක්ෂක ආඥාවක් සහ ආරක්ෂක ආඥාවක් මඟින් අධිකරණයට කළ හැකි නියෝග හෝ තහනම් කිරීම් මොනවාද?

වගඋත්තරකරු විසින් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු කිරීම හෝ සිදු කිරීමට සැලැස්වීම තහනම් කිරීම.

පීඩාවට පත් තැනැත්තාගේ වාසස්ථානයට, සේවා ස්ථානයට හෝ ළමයකුගේ පාසලට ඇතුළු වීම තහනම් කිරීම.

හිරිහැරයක් සිදුවන පරිදි පීඩාවට පත් තැනැත්තා පසුපස ගමන් කිරීම වැළැක්වීම.

පීඩාවට පත් තැනැත්තා සමඟ සම්බන්ධතාවක් ඇති කර ගැනීමට උත්සාහ කිරීම තහනම් කිරීම.

පීඩාවට පත් තැනැත්තා ළමයක සමඟ සම්බන්ධතා පවත්වාවීම තහනම් කිරීම.

පීඩාවට පත් තැනැත්තා හවුලේ බුක්ති විඳින සම්පත්වලට ප්‍රවේශ වීම වැළැක්වීම.

පීඩාවට පත් තැනැත්තා අසරණ තත්ත්වයට පත් කරන පරිදි වෛවාහික නිවහන පිටමණ්ඩි, පැවැත්ම හෝ ඇත්තෑපා කිරීම තහනම් කිරීම.

මෙම පනත යටතේ ඉල්ලීමක් කිරීමේදී වගඋත්තරකරු ගෘහයෙන් ඉවත් කිරීමට ඉල්ලීම අවිධාරයය නොවේ. එය තීරණය කරනුයේ සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවේ බරපතළකම අනුවය.

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාව පැවැත්වීම පමණක් ප්‍රමාණවත් නම් එය පමණක් භවත්වන ලෙස නියෝග කරන මෙන් අධිකරණයෙන් ඉල්ලා සිටිය හැකිය. වගඋත්තරකරු ගෘහයෙන් ඉවත් කිරීමට නියෝගයක් දෙන විට වගඋත්තරකරුට වාසය කිරීමට වික්‍රල්ප ස්ථාන තිබේද යන්න අධිකරණය සලකා බලනු ලබයි.

02 විවාහක පාර්ශ්වයන් වසර හතක කාලයක් වෛවාහක සබඳතා නොපවත්වමින් කාලයක් වෙන්ව වාසය කිරීම මඟින් දික්කසාදය ලැබේද?

ඉහත දැක්වා ඇති ආකාරයෙන් වසර හතක කාලයක් වෙන්ව ජීවත් වූ පමණින් නිරායාසයෙන් දික්කසාදය නොලැබේ. මේ සඳහාද දිසා අධිකරණය දික්කසාද නඩුවක් පැවරිය යුතු වෙයි. එලෙස පවරන නඩුවේදී වෙන්ව සිටීමේ හේතුව මත දික්කසාදයක් ඉල්ලා සිටීමේ හැකියාව ඇත.

03 අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාව මත අවලංගු කිරීමේ නීති තත්ත්වය

මේ සම්බන්ධයෙන් 2017 අංක 5 දරන අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාව මත අවලංගු කිරීමේ පනත අදාළ වෙයි.

මෙම පනත පනවනලීමේන් පසු ලියන ලද තෑගි ඔප්පුවක් අවලංගු කිරීම සඳහා දිසා අධිකරණය වෙත යොමු විය යුතු වෙයි.

එසේ පනවන් 3 වැනි වගන්තියට අනුව ඔප්පුව ලියන ලද දින සිට වසර 10ක් තුළ, එසේම මලවන් අකෘතඥතාව ඇති වී වගේ, නඩු තීන්දුවක ඇති වී වසර දෙකක් තුළ නඩු පැවැරීම කළ යුතු වෙයි. නමුත් ඔප්පුව ලියා වසර 10ක් ඉකුත් වූ පසු නඩු පැවැරීමේ හැකියාව අහිමි වෙයි.

04 ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රීඩා වැළැක්වීමට නීතියේ ඇති ප්‍රතිපාදන කවරෙද?

2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත මඟින් පවුලක් තුළ ජීවත් වන සියලු සාමාජිකයන්ට විඳින හිංසාකාරී ක්‍රියාවලින් ආරක්ෂා වීමට විධිවිධාන සලසා දී ඇත.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව ක්‍රියාවකින් පීඩාවට පත් තැනැත්තකුට හෝ තමාට පීඩාවක් සිදුවීමට ආසන්න යැයි සාධාරණ ලෙස සැක කළ හැකි පුද්ගලයකුට ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීම සඳහා ආරක්ෂක ආඥාවක් අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයෙන් ලබාගත හැකිය.

ළමා අපයෝජනය යනු කුමක්ද?

කළ යුතු ක්‍රියාවක් නොකර සිටීමෙන් හෝ නොකළ යුතු ක්‍රියාවක් කිරීම මඟින් දරුවකුගේ මනසට, සෞඛ්‍යයට හෝ වර්ධනයට හානියක් සිදු කිරීම හෝ දරුවාව ආහරණ කරදරයකට පත් කිරීම (මිනිස්‌ප්‍රයාශ කිරීම) ළමා අපයෝජනය වේ.

■ ළමා අපයෝජන වර්ග මොනවාද?

ශාරීරික අපයෝජනය :- ළමයා ශාරීරික වශයෙන් පීඩාවට පත් කිරීම. (පිලිස්සීම්, පහරදීම්, අත් පා බැඳීම, දණ ගැස්සවීම, වොතු ඇනීම, ගෙනිත්තීම.)

මානසික අපයෝජනය :- සතු යුතු ක්‍රියාවක් නොකර සිටීමෙන් හෝ නොකළ යුතු ක්‍රියාවක් සිදු කිරීමෙන් දරුවාගේ මානසික පීඩාවක් කිරීම. (අවශ්‍ය ආදරය නොදීම, නිතර බිය වැදීම, නිතර දරුවා විවේචනය කිරීම, දරුවා අගය නොකිරීම, දරුවා ප්‍රශ්දකාරව හැඩීම.)

ලිංගික අපයෝජනය :- දරුවකු ලිංගික ක්‍රියාවක් සඳහා යොමු කිරීම හෝ එසේ කිරීමට උත්සාහ කිරීමයි. (ලිංගිකත්වයට ලෙඹඹීම, ඡායාරූප ගැනීම, ලිංගිකත්වය මුසු කතා කීම, ලිංගික අවසර ස්පර්ශය, ස්පර්ශ කිරීමට කීම.)

නොසලකා හැරීම :- දරුවකුට අවශ්‍ය ආදරය, පෝෂණය, ආරක්ෂාව, අධ්‍යාපනය, ඇඳුම් පැලඳුම් ලබා නොදීම.

ළමා මෙහෙයෙහා සේවය.

ළමා සොල්දාදුවන් :- ශුද්ධ සඳහා ළ මයින් යොදා ගැනීම.

■ ළමා අපයෝජන පැමිණිල්ලක් සටහන් කරන නිලධාරියිය හෝ නිලධාරිණිය අවධානය යොමු කළ යුතු කරුණු

i) ලිංගික, භාරිය හෝ හිංසාකාරී සිදුවීමක් පිළිබඳව පැමිණිල්ලක් කිරීමට පැමිණෙන විඳවිත්‍ය කාන්තාව හෝ දරුවන් ඉතා කරුණාවෙන් සහ ආදරයෙන් පිළිගත යුතුය.

ii) ප්‍රිය වචනයෙන් ඔවුන් සමඟ කතා කිරීම.

iii) අපක්ෂපාතීව කටයුතු කිරීම.

iv. පොරතුරු සටහන් කර ගැනීමේදී පොරතුරු ප්‍රකාශ කරන තැනැත්තාට දෝෂාරෝපණය කිරීමෙන් වැලකීම.

v) නිහතමානී වීම.

vi) හිංසාවට පත් කාන්තාවගේ හෝ දරුවන්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍ය ආරක්ෂා කිරීම.

vii) දීර්ඝ වශයෙන් පොරතුරු සටහන් කර ගැනීමෙන් විඳදිනකා වෙෂසට පත් නොකර අවශ්‍ය විවේචකය ලබාදී පහසු ලෙස පොරතුරු එාරිතා කිරීම.

■ විඳදිනකා වෛද්‍ය පරීක්ෂණයට භාජන කරන ආකාරය

හිංසාවට පත් කාන්තාව හෝ දරුවා හැකි ඉක්මනින් (පසය 24 තුළ) වෛද්‍ය පරීක්ෂණය සඳහා යොමු කළ යුතුය. අධිකරණ වෛද්‍යවරයකු වෙත ඉදිරිපත් කිරීම ඉතා යෝග්‍ය වේ. එය අපහසුනම් වෛද්‍යවරයකු වෙත හෝ රෝහලකට අනුඵල කළ යුතු වේ.

05) ළමා අපයෝජන සිදුවීමේ සම්බන්ධව අපරාධ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය මඟින් ප්‍රතිචාර දැක්වීම සාර්ථක වීමට අවශ්‍ය සාධක

විඳදිනයා අප්‍රමාදව පොලිසියට පැමිණිල්ලක් හෝ කථාවක්තරයක් ලබාදී අදාළ සිදුවීම සම්බන්ධව සාර්ත්‍යතාන්මිය ප්‍රකාශයක් ලබා දීම.

පැමිණිල්ල පිළිබඳව අප්‍රමාදව සහ අපක්ෂපාතීව අපරාධ හා වෝදාරික විමර්ශන පැවැත්වීම.

අප්‍රමාදව නඩු පවරා ඊට අදාළ නඩුව විභාග කිරීම.

නඩු විභාගයේදී විඳදිත පාර්ශ්වය නොකිරීමව සත්‍ය ප්‍රකාශ කරමින් සාක්ෂි ලබාදීම.

නඩුව සම්පූර්ණයෙන් විභාග කොට නඩු විභාගය හැකි ඉක්මනින් සමාප්ත කිරීම.

නඩුව සාධාරණ ලෙසත් තීක්ෂනතුගුදු ලෙස විනිශ්චයට භාජන කිරීම.

දෛනික ජීවිතයේදී
මව්බිම පාඨකයන් සිඩාවට
පත් කරන නීතිමය ප්‍රශ්න ගැන සෑම
බදාදා දිනකම 'ගයිඩ්ලයින්' පිළුවෙන්
පිළිතුරු ලබාදේ. නීති ආචාර කොමිෂන් සභාවේ
විද්වත් නීතිඥ කණ්ඩායමක් විසින් එම පිළිතුරු
සම්පාදනය කරනු ලැබේ.
ඔබේ ගැටලුව මව්බිම ලීගල් ඒඩ්, නීති ආචාර
කොමිෂන් සභාව, 129, මහාධිකරණ සංකීර්ණය,
අලුත්කඩේ, කොළඹ 12, දුරකථන 011 2433618 හෝ
ඊමේල් legalaidcommission1978@gmail.com
වෙත යොමු කරන්න.
උපදෙස් සහ ලිපි සැකසුම
නීතිඥ දර්ශිකා මඩුගල්ලේ
නීතිඥ නිලූෂා කුමාරි වීජේරත්න
නීති නිලධාර
නීති ආචාර කොමිෂන් සභාව

ශ්‍රී ලංකාවේ බෞද්ධ විහාර හා දේපළ නීතිය

i කොටස

අශෝක අධිරාජයයාගේ ධර්මදූත දේවෙයේ ප්‍රතිරූපයක් ලෙස ශ්‍රී ලංකාවේ බුදු දහමෙහි ආගාසය ලබාගැනීමට හැකියාව ලැබිණි. එලෙස මිහිඳු මහ රහතන් වහන්සේගේ ආගමනයත් සමඟ ශ්‍රී ලංකාවෙහි බුද්ධ ධර්මය වාසනා වූ හමුත් මිහිඳු මහ රහතන් වහන්සේගේ ආගමනයට පෙරද ශ්‍රී ලාංකිකයන් බුද්ධ ධර්මය පිළිබඳව දැන සිටිය බවට ශ්‍රී ලංකාවේ වංශ කතාවල සඳහන් වේ. කෙසේ හමුත් මිහිඳු මාහිමියන් උළෙව්වට ධර්මය රැගෙන ළඟින් අනතුරුව සෑම රාජ්‍ය පාලකයකුගේම ලබුණු නිසා මහ බෞද්ධ සංඝරත්න හා බෞද්ධ නීති සංග්‍රහ වහන්සේලා අතර බොහෝවිත් ප්‍රචලිත වීමත් ඒවාට අනුකූලව කටයුතු කිරීමත් ආරම්භ විය.

ශ්‍රී ලංකාවේ බෞද්ධ විහාරයක (පන්සලක) නීතිමය ආරවුලක් ඇති වූ අවස්ථාවක එම ආරවුල විසඳීම සඳහා අදාළ කරගත හැකි මූලික නීතිය අඩංගු වන්නේ 1931 අංක 19 දරන බෞද්ධ විහාර හා දේවාලගම් පනතේය. ආරවුලක් විසඳීමේදී මෙහේ යම්කිසි නෛතික ක්‍රියාමාර්ගයක් ගැනීමේදීද මෙම නීතිය අදාළ කරගත හැකිය.

"මෙම පනතේ ඇති විධිවිධාන ලංකාවේ ඇති සෑම පන්සලකටම අදාළ කරගත හැකිය. නමුත් ඇමැතිවරයාට යෙදවී කිසිවේදනයක් මඟින් මෙම නීතියෙන් දළදා මාලිගාව, ශ්‍රීපාද ස්ථානය, අටමස්ථානය හෝ අනිත් මිහඳන පන්සලක් නිදහස් කළ හැකිය."

යනුවෙන් මෙම පනතේ 03 වැනි වගන්තිය මඟින් උක්ත වූහ.

මේ අනුව බලන විට පොදුවේ සෑම පන්සලක් සඳහාම මෙම පනතේ නීතිය බලපාන බව පෙනේ. පනතේ 4 (1) වගන්තිය අනුව සෑම පන්සලකටම අයත් දේපළවල පාලනය මෙම පනත යටතේ පත්කරන භාරකරුවා භාර වෙයි. පනතේ 4 (1) වගන්තියේ ක්‍රියාකාරීත්වයන් නිදහස් කරන ලද, එහෙත් මුල් පනතේ ක්‍රියාකාරීත්වයන් නිදහස් නොකරන ලද පන්සලවල දේපළ "පාලක විහාරාධිපති" යන නමින් හඳුන්වනු ලබන එම පන්සලේ විහාරාධිපති වෙත භාර කරනු ලබයි.

"පන්සලක්" යනුවෙන් විහාර වනුයේ විහාරයක්, දාගැබක්, දේවාලයක්, කෙවිලියක්, ආවාසයක් හෝ බෞද්ධයන් විසින් වන්දනාමාන කරන ඕනෑම ස්ථානයක් සහ දළදා මාලිගාව, ශ්‍රී පාද ස්ථානය, අටමස්ථානය ඇතුළත් වන බව පනතේ සඳහන් වේ. මේ අනුව කෙවිලියක්, දේවාලයක් වැනි තැන්වල පන්සල යන නිර්වචනය තුළට වැටෙන නිසා එම ස්ථාන සඳහාද "පන්සල" යන නිර්වචනය යොදා ගැනෙන පනතේ 04 වැනි වගන්තියට යටත්වම පනතේ නීතිය අදාළ කරගත හැකිය.

සාමාන්‍ය බෞද්ධ ජනතාව සහ අනෙකුත් ගිහි අය පන්සල යන්නට බෞද්ධ ස්වාමීන් වහන්සේලා වැඩ වසන විහාර හා දාගැබ්වලින් සමන්විත ස්ථානයක් පන්සල ලෙස හැඳින්වුවද මෙම බෞද්ධ විහාර හා දේවාලගම් පනත අනුව කෝවිලක් හා දේවාලයක්ද පන්සලක් ලෙස අර්ථ නිරූපණය කර අදය.

යම්කිසි ගොඩනැගිල්ලක් භික්ෂූන් වහන්සේලා සහ ගිහියන්වන් බෞද්ධ ආධ්‍යාත්මය දියුණු කිරීම සඳහා පූජා කර ඇති අවස්ථාවක එම භූමිය පසුව වන්දනාමාන කිරීම සඳහා යොදා ගත්තද එය පන්සල යන අර්ථ නිරූපණය තුළට නොවැටෙන බව නඩු තීන්දු මඟින් තීරණය කර අදය. බෞද්ධ අධ්‍යාපනය සඳහා පූජා කර ඇති මාලිගාකන්දේ විදෙදාලය පිරිවෙන, පන්සල යන අර්ථ නිරූපණය තුළට නොවැටෙන බවත්, මෙයට අදාළව පුළුඟ භාර ආඥා පනත යටතේ වලංගු ප්‍රළය භාරයක් නිර්මාණය වී තිබීම මඟින් එය බෞද්ධ විහාර හා දේවාලගම් පනත මඟින් පාලනය නොවන බවත්, මේ අනුව යම් ස්ථානයක් පන්සලක්ද නැද්ද යන්න තීරණය කිරීමේදී එහි ඇති ගොඩනැගිලි දෙස බලා හෝ එකී ධාතා දෙපළ දෙස බලා තීරණය කිරීමට වඩා එහි අභ්‍යන්තරය සොයා බැලිය යුතු බවත් මහාව පසාදදීපි වේ.

ඒ අනුව යම්කිසි ස්ථානයක් බෞද්ධ විහාර හා දේවාලගම් පනත යටතට අදාළ වන්නේද යන්න පරීක්ෂණයක් ලෙස සොයා බැලිය යුතු කරුණු කිහිපයක් ඇත.

(අ) එම ස්ථානය බෞද්ධ වැඳුම් පිළිම ලබන ස්ථානයක්ද

(ආ) එම ස්ථානය සාඝික කර ඇති අලිඹුණු එනම් පූජා කර ඇති අලිඹුණු කුමක්ද යන්න සොයා බැලිය යුතුය.

මෙම කරුණු දෙස මූලිකව සොයා බැලීමේ තුළින් එය පන්සලක්ද යන්න තීරණය කර ගත හැකිය. අදාළ ස්ථානය බෞද්ධ වැඳුම් පිළිම ලබන ස්ථානයක් නම් එය "පන්සල" යන අර්ථ නිරූපණය තුළට ගත හැකිය.

විහාරාධිපති යනුවෙන් වාසික හෝ ගිහිවාසික වුවද පන්සලක ප්‍රධාන භික්ෂූව අදහස් වන බව අර්ථ නිරූපණය ඔඟින් දැක්වා ඇත. භික්ෂූවක් "පාලක භික්ෂූවක්" හෝ "වාසික භික්ෂූවක්" විය හැකිය, එසේ නැත්නම් "ගිහිවාසික භික්ෂූවක්" හෝ ආගන්තුක භික්ෂූවක් විය හැකිය. පාලක භික්ෂූව විහාරාධිපති ලෙස හඳුන්වයි. එසේම "අධිපති" හෝ අධිකාරි භික්ෂූව ලෙසද හඳුන්වනු ලබයි.

අධිකාරි භික්ෂූවක් හාමියෝජකවක් ඔඟින් පූර්වගාමී භික්ෂූවක් විසින් පත් කරනු ලබයි. එසේ නැත්නම් පරම්පරාවේ ශිෂ්‍යයන් අතරින් කෙනකු හෝ ගරු ගනු ලබන අතර මෙය බෙදීය හොසකරි තනි ධූරයක් වේ.

පනතේ 20 වැනි වගන්තියට අනුව බෞද්ධ විහාරයක් සතුව ඇති ගිහිවිල හා චංචල දේපළ එම විහාරයේ භාරකරු හෝ පාලක විහාරාධිපති මත පැවැරෙන බව සඳහන් වේ. පනතේ 18 වැනි වගන්තියේ භාරකරු හෝ පාලක විහාරාධිපති කෙනකු විසින් නඩු පැවරිය හැකි බව සඳහන් කර අදය. පාලක විහාරාධිපති කෙනකු විමට මූලික සුදුසුකම වන්නේ එම භික්ෂූව මුලුන්ම විහාරාධිපති කෙනකු විය යුතු වීමය.

ඒ අනුව යම් භික්ෂූවක් පාලක විහාරාධිපති වරයකු ලෙස හැඳින්වීමට නම් එම භික්ෂූව විසින්,

එම පන්සලේ විහාරාධිපති විය යුතුය

එම පන්සලේ ජීවත් විය යුතුය

එම පන්සලේ විධිධ කටයුතු පාලනය කළ යුතුය. මෙම කරුණු නීතිමය සම්පූර්ණ කරයි නම් උක්වනන්සේට පනත යටතේ පාලක විහාරාධිපති කෙනකු හතු සියලු අයිතිවාසිකම් හා බලතල ඇතිව වීදුය හැකිය.

භාරකාර (Trustee) යන්න පහත පරිදි අර්ථ නිරූපණය කර ඇත. පනතේ විධි විධාන යටතේ පන්සලට පත් කරන ලද භාරකරුවකු ලෙස හැඳින්වේ. රිට දියවින්න නිලමේ බස්නායක නිලමේ කෙනකු සහ අරමස්ථාන කොමිටිය ඇතුළත් විය හැකිය.

පන්සලකට භාරකරුවකු පත් කිරීමේදී මුලින්ම එම භාරකරුවන්ට ඒ සඳහා අවසර සුදුසුකම් තිබිය යුතුය. එම සුදුසුකම් කෙනෙකුද යන්න පනතේ 11 සහ 14 වගන්ති ඔඟින් දැක්වා ඇත.

(අ) එම පත් කිරීමට ගියමේන භාරකරු, කලින් විහාරයක් සතු දේපළ සම්බන්ධයෙන් "විශ්වාසය ඩබ කිරීමක්" යන වරද කොකළ අයකු විය යුතුය. මේම තමා යුතුකම් ඉෂ්ට නොකර එම භාරකාර ධූරයෙන් ඉවත් කළ අයකු හෝ විය යුතුය.

(ආ) ඔහු හොරකමකාර, වංචාකාරයා, ව්‍යාජ ලේඛනයන් සම්බන්ධව බොරු සාක්ෂි දීමක් සම්බන්ධව හෝ අපකීර්තිමත් අරාධධකරව වරදකාරවඵ නොවූ අයකු විය යුතුය.

(ඇ) රජයේ සේවකයකු නොවිය යුතුය.

(ඈ) පාරිලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලක අධිකාරියක සාමාජිකයකු නොවිය යුතුය.

(ඉ) ඔහුගේ වයස අවුරුදු 70 ඉක්මවා ඇත්නම් පත්වීමට පෙර බෙදද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්ගෙන් අවසර ගත යුතු වේ.

මෙම සුදුසුකම්වලින් යුක්ත අයකු සොයාගත නොහැකි නම් විහාරාධිපති කෙනකු විසින් යෝජනා කරන ලද වෙනත් තැනැත්තකු පත්කර ගත හැකිය.

භාරකරුවකු විසින් සිය ධූරයේ කටයුතු ආරම්භ කිරීමට පෙර තමාගේ යුතුකම් නිසි පරිදි ඉටු කරන බවට ඇපයක් තැබිය යුතු බවද බෙදද්ධ විහාර හා දේවාලගම් නිතියේ සඳහන් වේ. එම භාරකරු කිසිම්කු නම් එම පෞද්ගලික ඇපය වෙනුවට ඇපකරුවකු පත් කිරීම ප්‍රතිණවත් වේ.

පන්සලක භාරකරු හෝ එකී පාලක විහාරාධිපති ඔහු කිසිවක පන්සලක සතු දේපළ සම්බන්ධව කරන ලද යම් විශ්වාසය ඩබ කිරීමක්, තමාගේ යුතුකම් ඉටු නොකිරීමක් හෝ යම් දුෂ්කෘතයක් කර ඇතැයි යම් පැමිණිල්ලක් කොමසාරිස් වෙත ලැබිය හැකිය. එසේ පැමිණිල්ලක් ලැබුණු විට ඒ පිළිබඳව විභාගයක් පැවැත්වීමට කොමසාරිස්වරයාට බලය ඇත. එම විභාගය අවසානයේ එම භාරකාර හෝ පාලක විහාරාධිපති විසින් එම වරද කර ඇති බවට ඔප්පු වන අවස්ථාවක සහ එම භාරකාර හෝ පාලක විහාරාධිපති පහ කිරීමට පිටවර ගැනීම සුදුසු බව ඔහුගේ මතය වන විට එම පාලක විහාරාධිපතිගේ හෝ භාරකාරගේ සේවය අත්හිටුවීය හැකිය. ඒ සම්බන්ධ ඒ සඳහා චෝදනා පත්‍රයක් ලිඛිතව ඉදිරිපත් කර ඒ සඳහා එම භාරකරුට හෝ පාලක භික්ෂූවට උත්තර දෙන ලෙස නියම කළ හැකිය.

කොමසාරිස්වරයා විසින් හෝ ඒ පන්සලට පිළිබඳ යම් සම්බන්ධතාවක් ඇති ඕනෑම පුද්ගලයකු විසින් ඉහත සඳහන් කර ඇති යම් චෝදනාවක් සම්බන්ධයෙන් එම පන්සල පිහිටා ඇති ප්‍රදේශයේ අධිකරණය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර හඳුවක් පැවැරිය හැකිය. එම චෝදනාව ලබා ඇති භාරකරුට හෝ පාලක විහාරාධිපතිට විරුද්ධව නඩු පැවැරිය හැකිය.

මෙම චෝදනා විභාග කිරීමෙන් අනතුරුව, එම අධිකරණය විසින් පහත සඳහන් විධාන කළ හැකිය.

(අ) එම භාරකරු විසින් හෝ පාලක විහාරාධිපති විසින් යම් කිසිවක කාර්යයක් කරන ලෙස විධාන කළ හැකිය.

(ආ) එම භාරකරු හෝ පාලක විහාරාධිපති විසින් එම පන්සලට කර ඇති අලාභය ගෙවන ලෙස තීන්දු ප්‍රකාශයක් කළ හැකිය. එසේම නඩු ගාස්තු ගෙවන ලෙස විධාන කළ හැකිය.

(ඇ) එම භාරකරු පත කිරීම සඳහා විධාන කළ හැකිය.

අදාළ පන්සලට යම් සම්බන්ධතාවක් ඇති කෙනකු එම පැමිණිල්ල ඉදිරිපත් කරන්නේ නම් එම පැමිණිල්ල සමඟ කොමසාරිස්වරයාගේ සහතිකයක්ද ඉදිරිපත් කළ යුතුය. එම සහතිකයේ පහත සඳහන් කරුණු 02 ගැන සඳහන් කර තිබිය යුතුය.

(අ) කොමසාරිස්වරයා විසින් එම චෝදනාව පිළිබඳව යම් විභාගයක් කර ඇති බව සහ

(ආ) එම චෝදනා අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට සුදුසු හා යෝග්‍ය බවට කරුණු එම සහතිකයේ සඳහන් වී තිබිය යුතුය.

මෙහිලා ඉහත සඳහන් කර ඇති පරිදි යම් චෝදනාවක් පිළිබඳව පැමිණිල්ලක් අධිකරණය වෙත ඉදිරිපත් කළ හැක්කේ කොමසාරිස්වරයා විසින් හෝ එම පන්සලට යම් සම්බන්ධතාවක් ඇති ඕනෑම අයකු විසින් පමණි. මෙම යම් සම්බන්ධතාවක් ඇති ඕනෑම පුද්ගලයකු විසින් ඉහත සඳහන් කර ඇති යම් චෝදනාවක් සම්බන්ධයෙන් එම පන්සල පිහිටා ඇති ප්‍රදේශයේ අධිකරණය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර හඳුවක් යම් යම් වන්දනාමාන කටයුතු කිරීම සඳහා පැමිණෙන ඕනෑම පුද්ගලයකු ලේ. ඒ පිළිබඳව 5 (3) වගන්තියේ විස්තර කර ඇත.

මෙම වගන්තිය යටතේ කටයුතු කරන විට මහා භාරකාර ආඥා පනතේ භාරය පිළිබඳ තත්ත්වය සහ ගිණුම් විමර්ශනය කිරීම සඳහා මහා භාරකාරවරයාට පවරා ඇති සියලුම බලතල මෙම ක්‍රියාකාරගය සම්බන්ධයෙන් කොමසාරිස්වරයාටද තිබිය යුතු බවත් නීතියේ පනවදිලිව ප්‍රකාශ කර තිබේ.

පන්සලක භාරකරුට තමන්ට අවශ්‍ය අවස්ථාවක ධූරයෙන් ඉල්ලා අස්වීය හැකිය. නමුත් නියමිත ආකාරයට ඉල්ලා අස්වීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක එය නැවත ඉල්ලා අස් කර ගත නොහැකිය.

භාරකරුවකු සිය ධූරයේ වැඩ භාරගැනීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, ඔහුගේ මරණය සිදුවන අවස්ථාවක, ධූරය අතහැර යෑම, අයෝග්‍යතාව, ඉල්ලා අස්වීම, ඉවත් කිරීම, අත්හිටුවීම හෝ වස්තු භංගත්වය යනාදී අවස්ථාවන ඒ සඳහා අනුප්‍රාප්තිකයකු පත් කරන තෙක් තාවකාලික භාරකරුවකු බෙදද්ධ කටයුතු පිළිබඳව කොමසාරිස්වරයා විසින් පත් කිරීමට බලය ඇත.

භාරකරුවකු ඉදිරිපිණෙන් බැහැරව යන අවස්ථාවක සිය ධූරයේ වගකීම් ඉටු කිරීමට එකී භාරකරු විසින් වෙනත් අයකු ඉදිරියේ සෑම සැකිය. එකී නාමිකෝපනා කිරීම බෞද්ධ කටයුතු පිළිබඳව කොමසාරිස්වරයාට වාර්තා කළ යුතුය. තාමිකා දේපළට අදාළ වැදගත් කරුණු පිළිබඳව ඉදිරි ලිපියක් ඔඟින් සාතවීජා කිරීමට බලාපොරොත්තු වේ.

නීතිඥ
ගංගා ජයාංගනී සෝමරත්න
නීති නිලධාර
ශ්‍රී ලංකා නීති ආචාර
කොමිෂන් සභාව